------------------------------------------------------------------------------------------------------------------------

## කන්තලේ ප්‍රාදේශීය සභාව

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 19 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 12 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් මස 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කන්තලේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මෙහෙයුම් කටයුතු සහ ආදායම් ඉපයීම සඳහා භාවිතා කර තිබූ රු. 24,231,745 ක ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කර නොතිබීමෙන් සභාවේ තත්‍ය වියදම ගිණුම්වල දක්වා නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ දී ඉදිකරන ලද ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු. 11,881,502 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ප්‍රධාන ලෙජරය අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ වර්ෂ අවසාන ශේෂය රු.48,186,304 ක් ලෙස දක්වා තිබුණ ද එය මූල්‍ය ප්‍රකාශන වල රු.48,508,674 ක් ලෙස දැක්වීමෙන් රු.322,370 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.3.3 ලැබිය යුතු ගිණුම්

වසර එකකට වැඩි කාලයක් ගත වී ඇති එකතුව රු. 1,287,648 ක් වූ හිඟ හිටි සේවක ණය අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබීම සහ ස්ථාවර වත්කකම්වල වටිනාකම පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකිරීම හා ලැබිය යුතු ගිණුම් ශේෂ සහ ගෙවිය යුතු ගිණුම් ශේෂ සමුච්චිත අරමුදලට මාරු කිරිම පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු.39,617,253 ක් වූ වත්කම් සහ වගකීම් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරිමට නොහැකි විය.

## 1.3.5 නීති,රීති,රෙගුලාසි වලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි සහ විධිවිධාන වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1989 අප්‍රේල් 17 දින අංක 554/ 5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය. | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබීම. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) නීති 1989 16 (1) වැනි වගන්තිය අනුකොටස් II | නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට පියවර ගෙන |

| | | |
|---|---|---|
| | ඔක්තෝබර් 10 උනැති අංක 41/90 දරන චක්‍රලේඛය | නොතිබීම. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 වැනි වගන්තිය | රු. 302,184 ක් වටිනා මාස 06 ක කාලය ඉක්මවා තිබූ නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් 26 ක් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කර නොතිබීම. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,533,325 ක් ව අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 18,235,596 ක් විය.

### 2.2 අයවැයගත පාලනය

සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා නොගත් අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, සත්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 4,327 | 5,403 | 8,955 |
| (ii) | බදු කුලී | 5,437 | 3,007 | 1,856 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 424 | 1,120 | - |
| (iv) | වෙනත් ආදායම් | 25,405 | 18,396 | 18,608 |

### 2.3.2 මුද්දර ගාස්තු

නැගෙනහිර පළාත් සභාවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු එකතුව රු. 738,768 ක් ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

### 2.4 ස්ථාවර තැන්පතු

2005 සැප්තැම්බර් 08 දින ආරම්භ කර තිබූ සභාව සතු මිලියන 04 ක වටිනාකමැති ස්ථාවර තැන්පතු සභාවේ හිටපු ලේකම්වරයා විසින් සංවර්ධන වැඩ සඳහා යොදවා ගැනීමට 2010 ජනවාරි මස 05 වන දින මුදල් කරවා ගෙන තිබුණි. එදිනම එයින් රු. මිලියන 01 ක මුදලක් සභාවේ ජංගම ගිණුමට බැර කර තිබුණු අතර, ඉතිරි රු. මිලයන 03 ක මුදල ඔහු විසින් සභාව වෙත ලබා දී නොතිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කොටසෙහි XLVIII පරිච්ඡේදය ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) මානව සම්පත් කළමනාකරණය